# විරැකියාව හමුවේ පීඩාවට පත්වන ශ්‍රී ලංකාවේ උපාධිධාරීන් පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

*කේ.පී.කේ.එච්. කුමාරසිංහ* [1]

වර්තමානය වන විට විරැකියාව සෑම රටකම අභියෝගයක් බවට පත්වී ඇති අතර එය  බොහෝ සෙයින් බලපෑම් කරන රටක් ලෙස ශ්‍රී ලංකාව හඳුන්වාදිය හැකිය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විරැකියාව නිර්වචනය කරනු ලබන්නේ අදාළ කාල පරිච්ඡේදය තුළ වැටුපකට, වේතනයකට, ලාභයකට පවුලේ ආදායම් වැඩි කිරීමට කිසියම් රැකියාවක් සොයමින් සිටින හෝ රැකියාවක් බලාපොරොත්තුවෙන් සිටින එහෙත් රැකියාවක් නොමැති වීම ලෙසය. රැකියා විරහිත උපාධිධාරීන් මුහුණදෙන ගැටලු මොනවාද යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි. විරැකියාව හමුවේ පීඩාවට පත්වන උපාධිධාරීන් පිළිබඳ විශ්ලේෂණාත්මකව අධ්‍යයනය කර විරැකියාව නිසා ඇති වන ප්‍රතිඵල හඳුනා ගැනීම මෙහි අරමුණ වේ. මෙම පර්යේෂණය මිශ්‍ර  ක්‍රමය යටතේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක පර්යේෂණයක් ලෙස සිදුකරන ලදි. දත්ත රැස්කිරීම සඳහා ප්‍රාථමික දත්ත හා ද්විතීයික දත්ත යොදා ගත් අතර එහිදී ද්විතීයික දත්ත ලෙස ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ ලේඛන, ලෝක බැංකු වාර්තා යොදා ගන්නා ලදි. පර්යේෂණය නියැඳිය ලෙස දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ, බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අවුරුදු 25-30 ත් අතර රැකියා විරහිත උපාධිධාරීන් 25 දෙනෙකුගේ දත්ත පර්යේෂණය සඳහා යොදා ගන්නා ලදී. එහිදී ප්‍රශ්නාවලී සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමය යොදා ගනිමින් දත්ත රැස්කර ගන්නා ලදී. විරැකියාව හමුවේ පීඩාවට පත්වන උපාධිධාරීන් අධ්‍යයනය කළ විට වැඩි වශයෙන් විරැකියාවෙන් පෙළෙනුයේ කලා විෂය ධාරාව යටතේ උපාධිය හදාරනු ලබන උපාධිධාරීන් බව පෙනීයයි. පර්යේෂණ අධ්‍යයනයේ නිගමනය වශයෙන් විරැකියාව හමුවේ උපාධිධාරින් මානසික පීඩාවට ලක්වීම, තම දෙමාපියන් රැක බලා ගැනීම පිළිබඳ පසුතැවීම, විවාහය සම්බන්ධ ගැටලු ඇතිවීම, කලකිරීම, ප්‍රචණ්ඩත්වය වැනි සමාජ විරෝධී හැසිරීම් ඇතිවීම හඳුනාගත හැකිය. නවෝත්පාදන හඳුන්වාදීම, රැකියාවට ගැලපෙන පරිදි උපාධිධාරීන්ගේ අධ්‍යාපන සුදුසුකම් වැඩිදියුණු කිරීමේ ක්‍රමවේදයන් සකස් කිරීම, යල්පැන ගිය අදහස් වලින් මිදී නූතනත්වයට ගැලපෙන පරිදි තාර්කික චින්තනයෙන් යුතුව කටයුතු කිරීමට දිරිදීම, රජයේ රැකියාවන් එකම අපේක්ෂිතාර්ථය නොවී පෞද්ගලික අංශයේ රැකියා වෙත ද යොමු කරවීම, ඉංග්‍රීසි හා තොරතුරු තාක්ෂණික දැනුම වැඩිදියුණු කරවීම, කලා උපාධිධාරීන්ගේ උපාධි රැකියා වෙළඳපොළට ගැලපෙන පරිදි සකස් කරවීම, වර්තමානයට ගැලපෙන පරිදි විෂය සම්භාරය නවීකරණය කරවීම පර්යේෂණ යෝජනා අතර වේ.

***ප්‍රමුඛ පදඃ*** අභියෝග, උපාධිධාරින්, නවෝත්පාදන , විරැකියාව

[1] දර්ශන අධ්‍යයන අංශය, කැලණිය විශ්ව විද්‍යාලය. hasinthakalani572@gmail.com